(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 6.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2024 දෙසැම්බර් 17 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

**කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත් කිරීම:**

(පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 2 සහ 4 සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 (3) ව්‍යවස්ථාව ප්‍රකාරව)

---

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1/2024

ගරු හේෂා විතානගේ මහතා,— කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් රජයේ ලියාපදිංචිය ලබාගෙන ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ ලියාපදිංචි කිරීමෙන් තොරව පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වා ගෙන යා හැකිද;

(iv) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා සපුරාලිය යුතු අවම මූලික සුදුසුකම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

57/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුදුලූනු වංචාව සම්බන්ධයෙන් පසුගිය කාලයේදී දැඩි කතිකාවක් ඇති වූ බව දන්නේද;

(ii) එම වංචාව සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) එම වංචාවට සම්බන්ධ පුද්ගලයන්ගේ සහ ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම වංචාව හේතුවෙන් සිදු වී ඇති අලාභය කොපමණද;

(vi) එම වංචාව සම්බන්ධයෙන් මේ වනතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

64/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ-නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෙවිලියාමඩු, කෝරලේපත්තුව-දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මයිලත්ත මඩු සහ මන්මුනේ-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් උන්නිච්චෙයි යන ප්‍රදේශවල සිටින ලක්ෂ හයක් පමණ වන පශු සම්පත් සඳහා තෘණ භූමි පවතින බවත්;

(ii) එහෙත් එම තෘණ භූමි, ''පශු සම්පත් තෘණ භූමි'' ලෙස මේ වනතෙක් ගැසට් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තෘණ භූමි, ''පශු සම්පත් තෘණ භූමි'' ලෙස ගැසට් නොකිරීමට හේතුව කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

77/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමේ අරමුණ කවරේද;

(ii) මේ වන විට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ලැබෙන ප්‍රතිලාභ කවරේද;

(iii) ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයට අරමුදල් ලැබෙන මූලාශ්‍ර කවරේද;

(ii) එම මණ්ඩලය තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

85/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පවතින වී තොග සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් වාර්තාවක් කැඳවූ දිනය කවරේද;

(ii) එම වාර්තාවට අනුව වී තොග පවත්වාගෙන යනු ලබන ආයතන/පුද්ගලයන් කවරේද;

(iii) එම එක් එක් ආයතනය/පුද්ගලයා පවත්වාගෙන යනු ලබන වී තොග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සහල් මිල පාලනය කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

96/2024

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගියදා ඇමරිකාවේ වොෂින්ටන් නුවර දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පැවැති සාකච්ඡා සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ගේ ගුවන් ටිකට්පත් වියදම් හා ගමන් වියදම් සඳහා වැය කරන ලද මුදල එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සාකච්ඡාවලදී ලසාඩ් සහ ක්ලිෆර්ඩ් චාන්ස් යන සමාගම් සඳහා ගෙවන ලද මුදල කොපමණද;

(iv) ඉහත සාකච්ඡා මගින් ශ්‍රී ලංකාවට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

99/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.10.21 දින සිට 2024.11.30 දින දක්වා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල සංශෝධනය කරන ලද අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අවස්ථාවේදී සංශෝධිත මිල එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉන්ධන මිල සංශෝධන, ඉන්ධන මිල සූත්‍රය අනුව සිදු කර තිබේද;

(iv) ඉහත සඳහන් ඉන්ධන මිල සංශෝධනය කරන ලද අවස්ථාවන්හිදී, ඉන්ධන මිල සූත්‍රයට අනුව සත්‍ය වශයෙන්ම සංශෝධනය විය යුතු මිල එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය රජය විසින් හඳුන්වා දෙන ලද ඉන්ධන මිල සූත්‍රය පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ලෝක වෙළඳපළේ ඉන්ධන මිල අඩුවීමේ වාසිය ශ්‍රී ලංකාවේ ඉන්ධන පාරිභෝගිකයන්ට ලබා දීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

106/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ආරම්භයේදී එහි ස්ථාපිත කිරීමට යෝජිතව තිබූ පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එම පීඨවල නම් කවරේද;

(iii) මේ වනවිට එහි ස්ථාපිත කර ඇති පීඨ සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය මේ වනතෙක් ස්ථාපිත නොකිරීමට හේතු කවරේද;

(v) එම ඉංජිනේරු පීඨය ස්ථාපිත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

129/2024

ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ්-19 වෛරසය ආසාදනය වීම හේතුවෙන් මිය ගිය පුද්ගලයන්ගේ මළ සිරුරු ආදාහනය කළ යුතු බවට රජය විසින් ගනු ලැබූ තීරණය මත ආදාහනය කරන ලද මළ සිරුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මිය ගිය එක් එක් පුද්ගලයාගේ නම, ස්ත්‍රී/පුරුෂ සමාජභාවය, ජාතිය, ආගම, සමීපතම ඥාතියාගේ නම, ලිපිනය, මළ සිරුර ආදාහනය කරන ලද දිනය හා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් මිය ගිය එක් එක් පුද්ගලයාගේ මරණ සහතිකයේ අංකය, මරණය ලියාපදිංචි කරන ලද දිනය හා දිස්ත්‍රික්කය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

131/2024

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති අධ්‍යාපන කලාප සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් අධ්‍යාපන කලාපයේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින ගුරු හිඟයට ස්ථිර විසඳුමක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.00ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121(2)හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 102 — වැඩසටහන 01 — † 2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හයදහස් පන්සියයක් (රු.6,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **102** | - | මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා | |
| | | | (2023 අංක 34 දරන විසර්ජන පනතේ සඳහන් අමාත්‍යාංශ නාමය දක්වා ඇත) | |
| **වැඩසටහන** | **01** | - | මෙහෙයුම් වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 6,500,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 6,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2024 දෙසැම්බර් 05 දින ඉදිරිපත් කරන ලද 2024 අංක 14 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 13 දක්වා එකතුව රු. 228,123,000,000

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නිවේදනය,— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ජේ. ජේ. ටෙක්ස්ටයිල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එවකට ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2024 අගෝස්තු 26 දිනැති අංක 2399/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.12.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල,— ශීර්ෂය 117 — වැඩසටහන 02 — † 2024 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන තිස්තුන් දහස් අටසිය දහහතකට (රු. 33,817,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **117** | - | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය<br>(2023 අංක 34 දරන විසර්ජන පනතේ සඳහන් අමාත්‍යාංශ නාමය දක්වා ඇත) | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | මූලධන වියදම් | <u>රු. 33,817,000,000</u> |
| | | | **මුළු වියදම** | **<u>රු. 33,817,000,000</u>** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2024 දෙසැම්බර් 06 දින ඉදිරිපත් කරන ලද 2024 අංක 15 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 14 දක්වා එකතුව රු. 234,623,000,000

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***